OL/2015/21-S-I,II

[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

21 S I,II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2015 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2015 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2015

| | |
|---|---|
| සිංහල භාෂාව හා සාහිත්‍යය I, II | පැය තුනයි |
| சிங்களமொழியும் இலக்கியமும் I, II | மூன்று மணித்தியாலம் |
| Sinhala Language and Literature I, II | Three hours |

## සිංහල භාෂාව හා සාහිත්‍යය I

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම ප්‍රශ්නවලට උත්තර සපයන්න.** මෙම ප්‍රශ්න පත්‍රය සඳහා **ලකුණු 40ක්** ලැබේ.
(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) උත්තරවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** උත්තරය තෝරන්න.
(iii) **ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.**
(iv) එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

● අංක **1** සිට **3** තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි **තදකළු අකුරෙන්** මුද්‍රිත කොටසේ අර්ථයට **වඩාත් සමීප අර්ථය** දෙන වචනය තෝරන්න.

1. **උඩක් බිමක් නොබලා** වැඩ නොකරන්නැයි ගුරුතුමා තම ශිෂ්‍යයාට අවවාද කළේ ය.
(1) වැඩිහිටි අවවාද නොතකා (2) අනුන්ගේ උපදෙස්වලින් තොරව
(3) කිසිවක් සොයා නොබලා (4) වටපිට නොබලා

2. සුමල්, ප්‍රදේශයේ ප්‍රචලිත ව ඇත්තේ **අනුන්ට ගිනි දෙන** කෙනකු ලෙසිනි.
(1) විපත් ඇති කරන (2) මුදල් ලබා දෙන
(3) ගින්දර ලබා දෙන (4) උදව්පදව් කරන

3. පසුගිය කාලයේ සිදු වූ දේවල් නිසා ඔහුගේ **තටු කැඩී ඇති බව** ගම්වැසියෝ පැවසූහ.
(1) මනස විකෘත වී (2) දුප්පත් වී
(3) අසනීප උග්‍ර වී (4) බලය පිරිහී

● අංක **4** සිට **6** තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට **වඩාත් සුදුසු** පදය තෝරන්න.

4. ලෝකප්‍රකට ක්‍රීඩිකාවක තමා අසල සිටිනු දුටු අමාලි ............................ පත් විය.
(1) වික්ෂිප්තභාවයට (2) සංකුලතාවට (3) සංවේදීභාවයට (4) සුරක්ෂිතතාවට

5. සාගරයේ රාත්‍රිය ගොඩබිමට වඩා ...................... ලෙසින් අලංකාර ය.
(1) අසදෘශ (2) පරිමිත (3) අපරිමිත (4) විස්මිත

6. මාර්ටින් වික්‍රමසිංහ සූරීන් සිංහල සාහිත්‍යයට කළ .................... සේවය පැසසිය යුතු ය.
(1) වන්දනීය (2) සම්භාවනීය (3) අභිභවනීය (4) අනභිභවනීය

7. අකාරාදි පිළිවෙළ **නිවැරදි ව** යෙදී ඇති පද පේළිය තෝරන්න.
(1) උෂ්ණත්වය, ඌෂ්මාක්ෂර, උල්ලංඝනය, උපදේශක
(2) කඩොලාන, කණ්ඩිය, කණිසම, කම්පනය
(3) ගාන්ධර්ව, ගිනිකොන, ගිම්හානය, ගුණධර්ම
(4) නිධානය, නිබන්ධනය, නැණසල, නේපථ්‍යාගාරය

8. සෑම පදයක ම අක්ෂර වින්‍යාසය **නිවැරදි ව** යෙදී ඇති පද පේළිය තෝරන්න.
(1) මධ්‍යස්ථානය, තාක්ෂනය, අළුත්වැඩියාව, පළපුරුද්ද
(2) කළමණාකරු, විශ්වසනීය, වාච්‍යාර්ථය, ජනශූණ්‍ය
(3) ශ්‍රේෂ්ඨ, පරිනාමය, පර්යේෂණ, අබිරුචිය
(4) අභිමත, සමීපස්ථ, පෙළපාලිය, ළයාන්විත

[දෙවැනි පිටුව බලන්න.

9. **අන්‍යාර්ථ සමාසයට** උදාහරණයක් වන්නේ,
(1) නැගෙනහිර ය. (2) පාසියුම ය. (3) ඉම්හිරි ය. (4) කෘෂිහානි ය.

10. 'ඔවුහු දරුවන්ගේ කෙළිසෙල්ලම් බලා සතුටු වූහ.' යන වාක්‍යයේ **කෙළිසෙල්ලම්** යනු,
(1) තද්ධිත පදයකි. (2) සර්වනාම පදයකි.
(3) යුගල පදයකි. (4) කෘදන්ත පදයකි.

11. **උක්ත නාමපද** පමණක් යෙදී ඇති වරණය තෝරන්න.
(1) ක්‍රීඩිකාවක, මිනිස්සු, ශිෂ්‍යයෝ, තුඹ (2) අපි, තරුණයෝ, ළමයෙක්, නිලධාරිහු
(3) මම, වනමෘගයෝ, ගායිකාවක, තරුණයෙක් (4) ගායකයෙක්, අපේක්ෂකයන්, ඇතැමෙක්, පියාණෝ

12. **උපසර්ගයක්** රහිත පදයක් ඇති වරණය තෝරන්න.
(1) නිෂ්ප්‍රභ, පරදේශ, අයැදුම්, නිදුක් (2) ප්‍රතිඵල, පරිභ්‍රමණය, අබිනික්මන, අධිභාරය
(3) අනුකම්පුව, අන්ධකාර, නිර්ලෝභී, විසම (4) අවප්‍රමාණය, සදහම්, සංවර්ධනය, ඉමහත්

13. "සම්පූර්ණයෙන් විනාශ කිරීම" යන්න සඳහා යෙදිය හැකි **තනි පදයක්** දැක්වෙන වරණය කුමක් ද?
(1) වියෝජනය (2) විසංයෝජනය
(3) විමංසනය (4) විධ්වංසනය

- අංක 14 සිට 16 තෙක් ප්‍රශ්නවල **තදකළු අකුරෙන්** මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

14. සීගිරි ගී ලියූවන් අතර **විදග්ධ** කවීන් සිටි බව කියැවේ.
(1) විදේශීය (2) විශේෂ (3) නිපුණ (4) ප්‍රසිද්ධ

15. **යථෝක්ත** කාරණය පිළිබඳ ව සැලකිලිමත් වන ලෙස නිලධාරියා තම සේවකයන්ට දැන්වී ය.
(1) දන්වන ලද (2) කීමට අපේක්ෂා කරන
(3) ඉහත කියන ලද (4) විශේෂයෙන් කියන ලද

16. හොඳ සාහිත්‍ය නිර්මාණයක් බිහිවීමට සාහිත්‍යකරුවා තුළ **ව්‍යුත්පත්තිය** ද තිබිය යුතු ය.
(1) උචිත අනුචිත දේ තෝරා ගැනීමේ හැකියාව (2) අලුත් දේ නිර්මාණය කිරීමේ හැකියාව
(3) නිරන්තරව කරන අභ්‍යාසය (4) අත්දැකීම් බහුල වීම

17. මුලින් දී ඇති ව්‍යාකරණ වර්ගයට අයත් **නො වන** පදයක් සහිත වරණය තෝරන්න.
(1) කෘදන්ත - නැටුම, ගයන්නේ, තොවිල්ල, පැවිල්ල
(2) සර්වනාම - අපි, එතුමා, ඔබ, ඔහු
(3) නිත්‍ය බහුවචන - ඇතැමෙක්, කෙනෙක්, අයෙක්, සමහරෙක්
(4) ක්‍රියා විශේෂණ - සෙමෙන්, වේගයෙන්, උවමනාවෙන්, අමාරුවෙන්

18. පූර්වස්වර ලෝප සන්ධියට උදාහරණයක් **නො වන** පදය තෝරන්න.
(1) දකුණත (2) මැදැඟිල්ල (3) දැත (4) දිවැස

19. මුලින් දී ඇති පදයට සමානාර්ථයක් **නො දෙන** පදයක් ඇතුළත් වරණය තෝරන්න.
(1) ආලෝකය - අලු, ප්‍රභා, පහන්, කාන්ති (2) කැලෑව - වල, අරණ, ළන්ද, රුකුල
(3) පොකුණ - විල, තඩාග, සරසි, තළා (4) ප්‍රසිද්ධ - පසිඳු, විශද, පළ, ලකළ

20. **විරුද්ධාර්ථවත්** පද යුගලයක් **නො වන** වරණය තෝරන්න.
(1) ප්‍රපාතය – මස්තකය (2) සම්භාවනීය – නින්දනීය
(3) සංවෘත – ආවෘත (4) සාමූහික – ඒකල

21. **පූර්ව ක්‍රියාවක්** යෙදී ඇති වාක්‍යය තෝරන්න.
(1) හොඳින් පාඩම් කළහොත් විභාගය ජයගත හැකි වේවි.
(2) ක්‍රීඩකයා දුවද්දී ප්‍රේක්ෂකයෝ ඔල්වරසන් දුන්හ.
(3) ගායිකාව ගීයක් ගයමින් නර්තනයක යෙදුණා ය.
(4) මම පොත කියවා නිදාගත්තෙමි.



Department of Examinations, Sri Lanka
Department of Examinations, Sri Lanka

22. **වැරදි** අදහස සහිත වරණය තෝරන්න.
(1) වෛකල්පික යනු අනිවාර්ය යන පදයෙහි විරුද්ධාර්ථ පදයයි.
(2) නිපාත, වාක්‍යවල මැද පමණක් යෙදී අර්ථ ප්‍රකාශ කරයි.
(3) අසිරිමත් යන පදයේ මත් යනු තද්ධිත ප්‍රත්‍යයකි.
(4) කව්සිළුමිණ යනු සමාස පදයකි.

23. **ඌෂ්මාක්ෂර** පමණක් ඇතුළත් වන වරණය තෝරන්න.
(1) ක, ශ, ස, හ, ග
(2) ච, ට, ප, ත, ද
(3) ෂ, ෆ, ස, ළ, ව
(4) ශ, ෂ, ස, හ, ෆ

- අංක **24** සිට **26** තෙක් දී ඇති ප්‍රස්තාව පිරුළුවලට **වඩාත් ගැළපෙන** අදහස සහිත වරණය තෝරන්න.

24. ආඬි හත්දෙනාගේ කැඳ හැළිය වගේ
(1) සාමූහික ව එක් වී යම් කාර්යයක් කිරීම
(2) අනුන් රැවටීමට ගොස් තමන් ම රැවටීම
(3) අර්ථ විරහිත කාර්යයක් සිදු කිරීම
(4) උත්සාහය මගින් ජයග්‍රහණය ලැබීම

25. නැග්ග ඉනිමගට පයින් ගැසුවා වගේ
(1) උපකාර ලබාගත් පසු උපකාර කළ තැනැත්තා අමතක කිරීම
(2) උපකාර කළ පසු ප්‍රත්‍යුපකාර අපේක්ෂා නොකිරීම
(3) ධනවත් වූ පසු දුප්පත් මිනිසුන් අමතක කිරීම
(4) ඉහළ නිලතලවලට පත් වූ පසු අනෙක් අයට නොසැලකීම

26. ඇටිකෙහෙල් කෑ උගුඩුවා වගේ
(1) තමන් කළ වරද තමන්ට ම දැනීම
(2) නොදන්නා දේ කිරීමට ගොස් අමාරුවේ වැටීම
(3) තමන් කළ වැඩ ගැන පසුතැවීමට පත් වීම
(4) දැන දැන ම වැරදි කර තමන් ම විඳ වීම

- අංක **27** සිට **29** තෙක් ප්‍රශ්නවල **ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍යය** තෝරන්න.

27. (1) අපි දක්ෂ දරුවන් වෙමු.
(2) අප දක්ෂ දරුවෝ වෙමු.
(3) අපි දක්ෂ දරුවෝ වෙමු.
(4) අප දක්ෂ දරුවන් වෙමු.

28. (1) දෙමාපියන් සියල්ලෝ ම රැස්වීමට සහභාගි වෙති.
(2) දෙමාපියන් සියල්ලන් ම රැස්වීමට සහභාගි වෙති.
(3) දෙමාපියෝ සියල්ලන් ම රැස්වීමට සහභාගි වෙති.
(4) දෙමාපියෝ සියල්ලෝ ම රැස්වීමට සහභාගි වෙති.

29. (1) ගුරුවරු ළමයි කැටුව චාරිකාව ගියහ.
(2) ගුරුවරුන් ළමයි කැටුව චාරිකාව ගියහ.
(3) ගුරුවරු ළමයින් කැටුව චාරිකාව ගියහ.
(4) ගුරුවරුන් ළමයින් කැටුව චාරිකාව ගියහ.

30. පහත දැක්වෙන වාක්‍යය ලේඛන ව්‍යවහාරයට හැරවූ විට **වඩාත් නිවැරදි** ලෙස ලැබෙන වාක්‍යය තෝරන්න.
"අපි කතා කළා ම සමහර අය හිනා වුණා"
(1) අප කතා කළ විට සමහරු සිනාසුණහ.
(2) අපි කතා කළ විට සමහරෙක් සිනාසුණේ ය.
(3) අපි කතා කළ විට සමහරුන් සිනාසුණහ.
(4) අප කතා කළ විට සමහරුන් සිනාසුණහ.

31. පහත සඳහන් කවියේ **තදකළු** අකුරෙන් මුද්‍රිත පද සඳහා යෙදෙන අර්ථ පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.

මෙ නිරිඳුගෙ දූ ළඳ
උලකුඩය දේවී **සඳ**
සොමි ගුණෙනි පුන් **සඳ**
පවති සිරි **සඳ** සිරින් ඇම **සඳ**

(1) කාන්තාව, චන්ද්‍රයා, උතුම්, කල්හි
(2) කල්හි, උතුම්, චන්ද්‍රයා, කාන්තාව
(3) උතුම්, චන්ද්‍රයා, කාන්තාව, කල්හි
(4) කාන්තාව, උතුම්, චන්ද්‍රයා, කල්හි

32. රූපකයක් සහිත වරණය තෝරන්න.
(1) පාළොස්වක සඳ පායනු වැන්නේ
(2) දුනුකෙයියා මලක් වගේ දුරට පෙනෙනවා
(3) වී පැදුරෙන් ඉගිලී යන කුරුල්ලකු ලෙසින්
(4) අම්මා සඳකි මම ඒ ලොව හිරුය රිදී

[හතරවැනි පිටුව බලන්න.

Department of Examinations, Sri Lanka
Department of Examinations, Sri Lanka

279576

- අංක **33** සහ **34** යන ප්‍රශ්නවල මුලින් ඉදිරිපත් කර ඇති පාඨ සඳහා **වඩාත් සමීප අර්ථය** දෙන වරණය තෝරන්න.

**33.** වැව මුල් කරගත් ජලාශ්‍රයකට විපතක් සිදු වේ නම් එය රටවැසි සියල්ලන්ට ම සිදු වන විපතක් වශයෙන් දූරාතීතයේ සිට ම සැලකිණි.
(1) ජල සම්පතට සිදු වන විපත් රටට ම සිදු වන විපතක් ලෙස අතීත කාලයේ දී සැලකිණි.
(2) වැවකට සිදු වන විපතක් රටවැසියන්ට සිදු වන විපතක් ලෙස සලකන්නට අතීත වැසියෝ පුරුදු වූහ.
(3) වැව මූලික කරගත් ජල සම්පතට විපත් සිදු වීම රටවාසීන්ට සිදු වූ විපතක් වශයෙන් අතීතයේ පටන් ම සැලකී ය.
(4) වැව මූලික කරගත් ජල සම්පතට හානි සිදු වීම රටට ම වූ හානියක් බව අතීත කාලයේ දී සැලකිණි.

**34.** මුල් වකවානුවේ සිට හත්වැනි සියවස තෙක් ලියැවී තිබෙන සෙල්ලිපි එක් ගණයකටත් එතැන් සිට ලියැවී ඇති සෙල්ලිපි තවත් ගණයකටත් ඒවායේ භාෂා ලක්ෂණ අනුව වෙන් කළ හැකි ය.
(1) සෙල්ලිපි වර්ගීකරණයකට ලක් කළ හැකි අතර එහි දී ඒවායේ භාෂා ලක්ෂණ සැලකිල්ලට ගැනේ.
(2) ලියැවුණු කාලය අනුව සෙල්ලිපි කොටස් දෙකකට වෙන් කළ හැකි අතර එහි දී සැලකිල්ලට ගෙන ඇත්තේ ඒවායේ භාෂා ලක්ෂණයි.
(3) සෙල්ලිපි ලියැවී ඇති කාලය අනුව භාෂා ලක්ෂණ දක්නට ලැබෙන අතර ඒවා කොටස් දෙකකට වර්ග කර ඇත.
(4) සෙල්ලිපි ලියැවී ඇති භාෂාවේ ස්වරූපය අනුව ඒවා වර්ග දෙකකට වෙන් කිරීමට හැකියාව ඇත.

**35.** බ්‍රාහ්මී සෙල්ලිපිවල 'නාඩීර' යනුවෙන් සඳහන් කර ඇත්තේ,
(1) පොල් ය. (2) පුවක් ය. (3) තල් ය. (4) කොස් ය.

**36.** පහත සඳහන් ජනකවියේ හතරවැනි පදය දී ඇති වරණ අතුරෙන් තෝරන්න.

"සිටිති පෙළින් පෙළ රන්තරු විලසට
ගනිති එරන් කැති දහසක් එමවිට
දමති එරන් කැති මාරුව අහසට
......................................................"

(1) නළා පිඹිති දෙපසේ බෙර නදකොට
(2) වලා යටින් සඳ පෑයූ විලසට
(3) බලා සිටිති රජු ඇවිදින් එතනට
(4) කපති ගොයම් අඟනෝ බැස කුඹුරට

**37.** "වෙසක් කැකුළ අතු අග හිඳ නටන විලාසේ
ඉරෙත් හඳෙත් සිරි විඳ විඳ රඟන විලාසේ"

'රේඛාව' චිත්‍රපටය සඳහා නිර්මාණය කරන ලද ඉහත සඳහන් පද ඇතුළත් ගීතයේ පද රචකයා,
(1) ලූෂන් බුලත්සිංහල මහතා ය. (2) ගරු මර්සලින් ජයකොඩි පියතුමා ය.
(3) මහගම සේකර මහතා ය. (4) සුනිල් දයානන්ද කෝණාර මහතා ය.

**38.** පහත සඳහන් පදාර්ථයෙහි අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

"සොඳුරු තුරුණු සියපත් සිය රස් වතුර
ඉඳුරු දෙසින් වැද නුබ ගඟ එත පැතිර"

(1) සුන්දර වූ තරුණ සූර්යයාගේ රශ්මිය නමැති ජලය නැගෙනහිර දිශාවෙන් ආකාශ ගංගාවට වැදී පැතිරෙන කල්හි
(2) සුන්දර වූ තරුණ සූර්යයාගේ රශ්මිය නමැති වතුර දිව්‍ය ලෝකය දෙසින් ආකාශ ගංගාව කරා පැතිර ගොස්
(3) සුන්දර වූ තරුණ නෙළුම් මල් සිය රශ්මි නම් ජලය නැගෙනහිර දිශාවෙන් විහිදුවා ආකාශ ගංගාව කරා පැතිර ගොස්
(4) සුන්දර වූ තරුණ නෙළුම් මල්වල පෙති ජලය මත පා කර දිව්‍ය ලෝකය දෙසින් ආකාශය කරා පැතිර යද්දී

**39.** "ලෝ දහමින් වැදෙනා රළු පහරින්
ගත සිත රිදෙනා කල නිතියෙන්
නැත ලොවේ අන් රසඳුනා
ආදරේ සේ සුව දෙනා"

යන ගී ඛණ්ඩය ඇතුළත් වන්නේ,
(1) මනමෙ නාට්‍යයේ ය. (2) සිංහබාහු නාට්‍යයේ ය.
(3) වෙස්සන්තර නාට්‍යයේ ය. (4) නරිබෑනා නාට්‍යයේ ය.

**40.** වැවක් ජලයෙන් පිරීගොස් වාන් දමන අවස්ථාවේ වැවේ ජල පහර චණ්ඩ වන අතර එයින් වැවට සිදු වන විනාශය වළක්වා ගැනීමේ අරමුණින් වැවට අධිපති දෙවියන්ට බාර වී සිදු කරන පූජාව හැඳින්වෙන්නේ,
(1) මුට්ටි නැමිල්ල නමිනි. (2) නානුමුරය නමිනි.
(3) නිහර වී පූජාව නමිනි. (4) වැවේ රාජකාරිය නමිනි.

* *



Department of Examinations, Sri Lanka

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**21 | S | I,II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2015 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2015 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2015

සිංහල භාෂාව හා සාහිත්‍යය I, II
சிங்களமொழியும் இலக்கியமும் I, II
Sinhala Language and Literature I, II

## සිංහල භාෂාව හා සාහිත්‍යය II

* ප්‍රශ්න **සියල්ලට ම** උත්තර සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන **80**කි.

**1.** (i) සිට (x) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර **නොලියන්නේ** නම්, එහි **අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) පහත සඳහන් එක් එක් වචනවල අන්තර්ගත පිල්ලම් අනුපිළිවෙළින් ලියන්න.
(අ) තුරඟා (ආ) හිරු

(ii) පහත සඳහන් වාක්‍යයෙහි ඇතුළත් උපසර්ග **දෙකක්** ලියන්න.
විරූපී මිනිසකුගේ ජීවිතය ඇසුරෙන් තැනුණු අනුවේදනීය කතා පුවතක් පුවත්පතක දුටුවෙමි.

(iii) පහත සඳහන් (අ) සහ (ආ) යටතේ දැක්වෙන අදහස්වලට ගැළපෙන තනිපදය බැගින් ලියන්න.
(අ) එකිනෙකට සම්බන්ධ ව පවතින
(ආ) යම් ස්ථානයකට බලහත්කාරයෙන් කඩාවැදීම

(iv) පහත සඳහන් වාක්‍ය ඛණ්ඩවල **තදකළු** අකුරෙන් මුද්‍රිත පද අයත් වන ක්‍රියා වර්ගය නම් කරන්න.
(අ) පොඩි නැන්දා **හිනාවෙවී** වෙලට ගෙනා මී කිරි
(ආ) ලොවට සාමය **උදාවේවා**

(v) පහත සඳහන් වාක්‍යයේ වචන **දෙකක** අක්ෂර වින්‍යාසය සදොස් ය. එම වචන **දෙක** පමණක් නිදොස් කර ලියන්න.
"පොදු ජන සිතෙහි විද්‍යාව රෝපනය කිරීමේ ප්‍රශ්නය ගැන සැලකිල්ල යොමු වී තිබෙන මෙවැනි යුගයක මේ විශිෂ්ට ප්‍රයත්නයට ප්‍රසංශා කළ යුතු ය."

(vi) පහත දැක්වෙන (අ) සහ (ආ) යෙදුම්වල පළමුවැනි වචනය සමඟ දෙවැනි වචනයේ නොගැළපීමක් ඇත. වඩාත් ගැළපෙන සේ පළමුවැනි වචනය හෝ දෙවැනි වචනය හෝ සකස් කර ලියන්න.
(අ) මුහුදු ඛාදනය
(ආ) සොබා ධර්මය

(vii) පහත (අ) සහ (ආ) හි දැක්වෙන වාක්‍ය සදොස් ය. ඒවා නිදොස් කර නැවත ලියන්න.
(අ) නිලධාරි මණ්ඩලයෙන් එක් අයෙක් ඉල්ලා අස්වෙති.
(ආ) සමිතියේ සාමාජිකාවන් නොහොත් ආයතනයේ සේවිකාවෝ රැස්වීමට සහභාගි වෙති.

(viii) පහත දැක්වෙන පද සන්ධි කොට ලියන්න.
(අ) සත් + හස (ආ) ගිරි + අග

(ix) පහත සඳහන් පද්‍ය පාදයේ **තදකළු** අකුරෙන් මුද්‍රිත පදවල අර්ථ වෙන වෙන ම ලියන්න.
**දළලඹ නිලඹ** ගැබ නැගි ගුම් අසාලා

(x) පහත දැක්වෙන යෙදුම් සඳහා වී ගොවිතැන ආශ්‍රිත භාෂා ව්‍යවහාරයෙහි යෙදෙන වචන ලියන්න.
(අ) කුරුල්ලන්ට කෑම පිණිස වෙන් කරන කුඹුරු කොටස
(ආ) කුඹුරක වටේට පස් සහ මඩවලින් සකස් කරන වැටිය (ලකුණු 20 යි.)

**2.** පහත දැක්වෙන **අ. ආ. ඉ. ඊ** යන විස්තර අතුරෙන් **එකක්** තෝරාගෙන **වචන 250කට නොඅඩු** වන සේ රචනයක් ලියන්න. ඒ සඳහා **යෝග්‍ය මාතෘකාවක්** ද යොදන්න.

(අ) අප දැනුමෙන් පරිපූර්ණත්වයට පත් කරන්නට සාහිත්‍ය පොතපත උපකාරී වෙයි. එහෙත් තාක්ෂණික ලෝකයේ අතරමංව සිටින වර්තමාන පරම්පරාව ක්‍රමයෙන් සාහිත්‍ය පොතපත පරිශීලනයෙන් ඈත් වෙමින් සිටිති. දිනෙන් දින සිය ගණනින් පොතපත පළ වුව ද ඒවා කියවන පිරිස සීමිත ය. මේ තත්ත්වය රටේ අනාගතය කෙරෙහි ඉතා අයහපත් ලෙස බලපායි. හිස් වූ මොළ ඇති මිනිසුන්ගෙන් පිරි රටක අනාගතය කෙබඳු වෙයි ද? ගුණධර්ම පිරි සමාජයක් කෙසේ අපේක්ෂා කළ හැකි දැ'යි යන්න අවිනිශ්චිත ය.

(ආ) රටක අනාගතය රඳා පවතින්නේ ළමා පරපුර මත ය. අනාගතයෙහි රට බබළවන්නේ ඔවුන් ය. එහෙත් වර්තමානයේ ළමා පරපුර අභාග්‍ය සම්පන්න ඉරණමකට මුහුණ දෙමින් සිටිති. දරුවන්ට සිදු වන විවිධ හිංසා, පීඩා, පැහැර ගැනීම්, අපයෝජන, මෙහෙකාර සේවයේ යෙදවීම්, අතරමං කර දැමීම් වැනි විවිධාකාර දේ ගැන නිරන්තරයෙන් අසන්නට ලැබේ. පිපෙන්නට වෙර දරන පුංචි මල් කැකුළු බඳු දරු පරපුර රැකගැනීම අප සියලු දෙනාගේ ම වගකීමකි. හෙට දවසේ වැඩිහිටියන් බවට පත්වන ඔවුන් ගුණධර්ම සපිරි සමාජයකට දායාද කිරීම අප සැමගේ ම යුතුකමකි.

[හයවැනි පිටුව බලන්න.

Department of Examinations, Sri Lanka

(ඉ) ශ්‍රී ලංකාව ඉපැරණි ඉතිහාසයකට උරුමකම් කියන රටකි. අපේ පැරණි සංස්කෘතික දායාද සහ උරුම ඊට සාක්ෂ්‍ය සපයයි. අපේ අනන්‍යතාව සුරක්ෂිත වී ඇත්තේ එම පැරණි උරුමයන් මත ය. අනුරාධපුර, පොළොන්නරු ඇතුළු පැරණි රාජධානිවල ඇති නටබුන්වලින් අපේ පැරන්නන් සතුව තිබූ විද්‍යාත්මක හා තාක්ෂණික ඥානය පිළිබිඹු වේ. පැරණි සංස්කෘතික හරපද්ධතිවලින් අතීත ජනතාවගේ හැදියාව හා සදාචාරය පිළිබිඹු වේ. එහෙත් ශ්‍රී ලංකාව බාහිර ලෝකයට අදූරදර්ශී ලෙස නිරාවරණය වීමත් සමඟ අපේ පැරණි උරුමය හා සංස්කෘතිය ක්‍රමයෙන් විනාශ වෙමින් පවතී.

(ඊ) ජලය නොමැති තැනක මිනිසකුට එක් දිනක් හෝ ජීවත් වීම අසීරු ය. ජලය එතරම් ම මිනිස් ජීවිතය හා බැඳී පවතී. මිනිසා විවිධ කාර්යයන් සඳහා ජලය යොදා ගන්නා අතර බීමට ගැනීම එයින් ප්‍රධාන වේ. ලෝකයේ බීමට සුදුසු ජලය ඇත්තේ ස්වල්පයකි. එහෙත් පරිසර දූෂණය, කෘමිනාශක භාවිතය ආදිය නිසා මේ ස්වල්ප වූ ජල ප්‍රමාණය ද තවත් අඩුවෙමින් හා දූෂණය වෙමින් පවතී. දූෂිත ජලය පානය කිරීම නිසා වැළඳෙන වකුගඩු රෝග, පිළිකා ඇතුළු විවිධ මාරාන්තික රෝග ගැන නිතර අසන්නට ලැබේ. රටක පැවැත්මට නිරෝගී ජනතාවක් සිටීම අත්‍යවශ්‍ය ය. එබැවින් ජලය සුරැකීම පිළිබඳ ව පියවර ගත යුතු කාලය එළඹ ඇත.

(ලකුණු 25 යි)

**3.** පහත සඳහන් ඡේදය වචන **50 - 60** අතර වන සේ **සාරාංශ කොට ලියන්න.** ඔබේ සාරාංශයේ වචන සංඛ්‍යාව උත්තරය අග ලියන්න.

පෙරදිග සංස්කෘතියේ හරය දැක පෙරදිග භාෂා, දර්ශන, ජීවන ක්‍රමය, කලා ශිල්ප, අපරදිගවාසීන්ට හඳුන්වා දුන් ශාස්ත්‍රඥයෝ කීපදෙනෙක් වෙති. ඔවුන් තුළ පැවැති නිර්මාණ ශක්තියත්, මානව දයාවත්, අපූර්ව ඥාන සම්භාරයත් නිසා පෙරදිග සංස්කෘතික දායාද අපරදිග තවමත් බැබළෙමින් පවතී. ශ්‍රීමත් විලියම් ජෝන්ස් සංස්කෘත භාෂාව අපරදිගට හඳුන්වා දුන්නේ ය. ස්වාමි රාමක්‍රිෂ්ණ හා ස්වාමි විවේකානන්ද පෙරදිග දර්ශනයන්හි හරය බටහිර ලෝකයට ප්‍රකාශ කළහ. රබීන්ද්‍රනාත් තාගෝර් පෙරදිග සංගීතය හා සිතුවම් කලාව බටහිරට හඳුන්වා දුන් දූතයා විය. අනගාරික ධර්මපාලතුමා නිව්යෝර්ක් නුවර ලෝක ආගම් සමුළුවේ දී කළ ප්‍රකාශය, බෞද්ධ දර්ශනය අපරදිග පැතිරවීමේ පෙරවදනක් විය. ආනන්ද කුමාරස්වාමි පෙරදිග සංස්කෘතියෙහි හා කලාශිල්පවල උදාරත්වය ලොව හමුවේ අභිමානවත් ලෙස ඉදිරිපත් කරන්නට උත්සුක විය. අපේ සංස්කෘතියෙහි හරය දැක එය ලොවට දායාද කරනු වස් මධ්‍යකාලීන සිංහල කලා නමැති විශිෂ්ට ග්‍රන්ථය ඇතුළු අනර්ඝ ග්‍රන්ථ සම්භාරයක් ලියූ ආනන්ද කුමාරස්වාමි සූරීන් ඉමහත් කෘතවේදිත්වයකින් සැමරිය යුතු ශ්‍රේෂ්ඨ ලංකා පුත්‍රයෙකි. නුවර සමයේ පැවැති පෞරාණික ගොඩනැගිලි ආරක්ෂා කර ගැනීමේ වැදගත්කම අවධාරණය කළ කුමාරස්වාමි ඒ සම්බන්ධ ව ප්‍රසිද්ධ පුවත්පතකට ලිපියක් ලියමින් දේශීය ගෘහනිර්මාණ ශිල්පයේ අනන්‍යතාව තත්ත්වඥයන්ගේ අවධානයට හසු කළේ ය. මෙබඳු ගොඩනැගිලි පිළිබඳ ව කිසිවකුගේත් නෙත්සිත් යොමු නොවූණු වකවානුවක මේ සිදුවීම විශේෂයෙන් සැලකිය යුතු කරුණකි.

(ලකුණු 10 යි)

**4.** පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති **ප්‍රශ්නවලට උත්තර** සපයන්න.

සාගරය ගවේෂණය කිරීමේ දී මිනිසා මුහුණ දෙන බාධක කිහිපයකි. එයින් බලවත් ම බාධකය නම් සාගර ජලකඳ මගින් ඇති කරනු ලබන පීඩනය හෙවත් තෙරපුමයි. කිමිදුම්කරුවකුට ආරක්ෂා සහිත ව කිමිදෙන්නට හැකි වනුයේ අඩි 200–300 දක්වා ගැඹුරක පමණි. ඉන් ඔබ්බෙහි ඇති පීඩනය මිනිස් සිරුරට ඔරොත්තු නොදෙන්නකි. හිරු එළිය අඩුවීම, සාගර පතුලේ දී මිනිසාට මුහුණ පෑමට සිදු වන තවත් බාධකයකි. අඩි දසදහසකට වඩා ගැඹුරකට විහිදෙන මුහුදු ආගාධවලට හිරු එළිය නොලැබෙන තරම් ය. එබැවින් සියලු පරීක්ෂණ යාත්‍රාවලට මේ අන්ධකාරය විනිවිද යෑමට තරම් ප්‍රබල ආලෝකධාරා රැගෙන යෑමට සිදු වේ. 1955 දී න්‍යෂ්ටික බලයෙන් ක්‍රියාකරන ප්‍රථම සබ්මැරීනය වූ නෝටිලස් නිපදවන ලදී. මෙතෙක් කිසිවකුට ළඟා විය නොහැකි ව තිබූ උත්තරධ්‍රැවයේ හිම තට්ටුව යටින් ගොස් අනෙක් පසින් මතුවීමට නෝටිලස් සබ්මැරීනය මිනිසාට උපකාරී විය. එතෙකුදු වුවත් ශාන්තිකර සාගරයේ පිහිටි මැරියානා ආගාධය දක්වා මෙතෙක් ගමන් කර ඇත්තේ මිනිසුන් දෙදෙනකු පමණි. ඔවුහු ඒ සඳහා 'බැතිස්කාෆ්' නම් කුඩා විද්‍යාත්මක සබ්මැරීනයක් යොදාගත්හ.

(i) සාගර ගවේෂණයේ දී මිනිසා මුහුණ දෙන ප්‍රධානතම බාධකය කුමක් ද?
(ii) මිනිසකුට මුහුදේ අඩි 200–300කට වඩා ගැඹුරට කිමිදෙන්නට නොහැකි ඇයි?
(iii) මුහුදු පතුලට හිරු එළිය නොලැබීමේ බාධකය පරීක්ෂණ යාත්‍රා ජයගත්තේ කෙසේ ද?
(iv) නෝටිලස් සබ්මැරීනය උපකාරයෙන් මිනිසා කළේ කුමක් ද?
(v) ඉහත ඡේදයෙන් සාකච්ඡා කර ඇත්තේ කවර මාතෘකාවක් ගැන ද?

(ලකුණු 10 යි)

**5.** සිරිපුර ග්‍රාමෝදය සමිතිය මගින් ප්‍රදේශයේ තරුණ නාට්‍යකරුවන් සඳහා වැඩමුළුවක් සංවිධානය කර ඇත. වැඩමුළුව පැවැත්වෙන දිනය 2016 ජනවාරි මස 20 වන අතර වේලාව පෙ.ව. 9.00 සිට ප.ව. 7.00 දක්වා වේ. ප්‍රධාන අමුත්තා වශයෙන් ප්‍රවීණ නාට්‍යවේදී නයන කලාපති මහතා සහභාගි වීමට නියමිත ය. වැඩමුළුව අවසානයේ කෙටි නාට්‍ය තුනක් ද වේදිකාගත වේ. වැඩමුළුව පැවැත්වෙන ස්ථානය වශයෙන් තෝරාගෙන ඇත්තේ සිරිපුර යොවුන් රඟහලයි.

පූර්වෝක්ත වැඩමුළුව සඳහා සිරිපුර යොවුන් රඟහල ලබා දෙන මෙන් ඉල්ලා ප්‍රාදේශීය ලේකම්තුමා වෙත යැවෙන රාජකාරි ලිපිය ලියන්න. ග්‍රාමෝදය සමිතියේ ලේකම් කවිඳු උඩවත්ත ඔබ යැ'යි සිතන්න.

(මේ සඳහා වචන **100**ක් පමණ ප්‍රමාණවත් ය.)

**නැතහොත්**

සිරිපුර එක්සත් සුබසාධක සංගමයට ආධාර ලබා ගැනීම පිණිස 2016 ජනවාරි මස 16 වැනි දින සිරිපුර යොවුන් රඟහලේ දී පියල් දමයන්තගේ 'මහසයුර කැළඹෙයි' නාට්‍යය පෙන්වීමට සැලසුම් කර ඇත. පෙ. ව. 10.30 හා ප. ව. 2.30 වශයෙන් දර්ශන වාර දෙකක් පැවැත්වෙන අතර 10.30 දර්ශනය පාසල් දරුවන්ට වෙන් කර ඇත.

ප. ව. 2.30 දර්ශනය නැරඹීමට ආරාධනා කරමින් සිරිපුර ප්‍රදේශීය ලේකම්තුමා වෙත යැවෙන ආරාධනා පත්‍රය සකස් කරන්න. සංගමයේ ලේකම් සඳරු වැලිවත්ත ඔබ යැ'යි සිතන්න.

(මේ සඳහා වචන **100**ක් පමණ ප්‍රමාණවත් ය.) (ලකුණු 15 යි)

* * *

Department of Examinations, Sri Lanka

OL/2015/21-S-III

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**21 S III**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2015 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2015 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2015

| | | | |
|---|---|---|---|
| **සිංහල භාෂාව හා සාහිත්‍යය** | **III** | | **පැය දෙකයි** |
| சிங்களமொழியும் இலக்கியமும் | **III** | | இரண்டு மணித்தியாலம் |
| Sinhala Language and Literature | **III** | | *Two hours* |

## සිංහල භාෂාව හා සාහිත්‍යය III

**වැදගත් :** උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න **පහකට** පමණක් උත්තර සපයන්න.
※ **1, 2, 3, 4** ප්‍රශ්නවලටත්, **5, 6, 7** ප්‍රශ්නවලින් **එකකටත්** උත්තර සපයන්න.
මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන **80**කි.

**1.** (i) සිට (x) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර **නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) (අ) රාහුල් ජූගේ චරිතය ඇතුළත් කෙටිකතාවේ මුල් රචකයා නම් කරන්න.
(ආ) රාහුල් ජූගේ චරිතයෙන් ඉස්මතු කෙරෙන යහපත් ගුණාංගය කුමක් ද?

(ii) "එහෙම වුණත් මා නොදන්න දෙයක් තියෙනවා අහන්න
දන්න කෙනෙක් හොයා බලා මට මේ ගැන කියා දෙන්න."
(අ) මේ ප්‍රකාශය කරන්නේ කවරෙක් ද?
(ආ) ඔහු පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්නය ඉදිරිපත් කෙරෙන කවි **දෙපදය** ලියන්න.

(iii) "මාලු ටික කපුටන් ගෙනියපුවහම අපේ බඩේ වැලි"
(අ) මේ ප්‍රකාශය ඇතුළත් කතාවේ කතුවරයා නම් කරන්න.
(ආ) මෙහි 'බඩේ වැලි' යන යෙදුමෙන් ප්‍රකාශ කෙරෙන අර්ථය දක්වන්න.

(iv) (අ) ඇන්ටන් චෙකොෆ්ගේ කෘතියක පරිවර්තනයක් සිංහල සාහිත්‍ය සංග්‍රහය පෙළ පොතේ ඇතුළත් වේ. එහි නම කුමක් ද?
(ආ) එහි පරිවර්තකයා නම් කරන්න.

(v) (අ) "කිසාගෝතමීයක නොවේ" පැදි පෙළෙහි, මවගේ ළමැදෙහි ගුළි වී සිටියේ කෙබඳු බිලිඳෙක් ද?
(ආ) පද්‍ය නිර්මාණයට අමතරව දයාසේන ගුණසිංහ සිය ප්‍රතිභාව විදහා දැක්වූ තවත් සාහිත්‍යාංගයක් නම් කරන්න.

(vi) පහත දැක්වෙන සාහිත්‍ය කෘති රචනා කෙරුණු රාජධානි යුග නම් කරන්න.
(අ) සද්ධර්මරත්නාවලිය
(ආ) යසෝදරාවත

(vii) ".... මපුතණුවන්ට සමාධියක් කරන්න."
(අ) මේ ප්‍රකාශය කරන ලද්දේ කිනම් අවස්ථාවක ද?
(ආ) මෙහි 'මපුතණුවන්' ලෙස හැඳින්වෙන්නේ කවරෙක් ද?

(viii) පහත දැක්වෙන ජාතක කථා පදනම් කර ගෙන ලියැවී ඇති කාව්‍ය ග්‍රන්ථ නම් කරන්න.
(අ) සත්තුභත්ත ජාතකය
(ආ) චන්ද කින්නර ජාතකය

(ix) "කැරලුන් මහෝත්සාහයෙන් විද ගත් ගස් සිදුරුවලින් ගිරවුන් ප්‍රයෝජන විඳිනා සේ මා රැස් කළ සම්පතින් වුවමනා ප්‍රයෝජන විඳින්නේ බත් බැළයාණෝ ය."
(අ) මේ ප්‍රකාශය කරන්නේ කවරෙක් ද?
(ආ) මේ ප්‍රකාශය රසවත් කිරීමට භාවිත කර ඇති කාව්‍ය අලංකාරය නම් කරන්න.

(x) (අ) 'කිඳුරු වලප' කවි පෙළ රචනා කර ඇති කාව්‍ය ආකෘතිය කුමක් ද?
(ආ) යසෝදරාවත රචනයේ දී භාවිත කර ඇති සුප්‍රකට වෘත්ත නම් කරන්න.

(ලකුණු 02 × 10 = 20 යි.)

[දෙවැනි පිටුව බලන්න.

Department of Examinations, Sri Lanka
Department of Examinations, Sri Lanka

**2.** පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨවල **තද කළු අකුරෙන්** මුද්‍රිත කොටස්වල අර්ථය වෙන් වෙන් ව ලියන්න. ඉන් පසු මුළු කොටසේ ම අර්ථය ලිහිල් බසින් ලියන්න.

(i) "පෙර අප දැන ඇඳින
ඉඳිනා හෙයින් නොව වෙන
ගෙයි ඇති **නොපදමින**
කළෙමු වියදම් මොබ තිබූ **දන**"

(ii) "..... ජීවකයන් තමා **වඩාගත්** පවතුත් ඔවුන් ශිල්ප උගත් පරිදිත් **කලහාණ** වූ ගුණ ඇති පරිදිත් කී ය."

(iii) "**සුදු සක** ලෙසට ඇත් පැටියෙක් විත් යහනේ
සුදු සොඬ ටිකෙන් මගෙ බඩ පිරිමදිති අනේ
**සුදු යම් දෙයක්** සිදු වෙයි මම දුටු සීනේ
සුදසුන් නිරිඳුනේ මොකදැ'යි ඔය සීනේ"

(iv) "...... අපාය නමැති **වඩබාමුඛයෙහි** වැටී **අනයවාසනයට** පැමිණෙන්නා වූ සත්ත්ව සමූහයා සේ ....."

(ලකුණු 05 × 04 = 20 යි.)

- **3, 4** යන ප්‍රශ්න සඳහා වන උත්තරයක වචන **125**ක් පමණ තිබීම සෑහේ.

**3.** (i) දිළිඳුකමේ පීඩිත බව හා
(ii) අවංකකමේ යහපත් බව

නිරූපණයට කතුවරයා දක්වා ඇති දක්ෂතාව 'පොළෝ කුහරයෙන් පැමිණි මිනිසා' කෙටිකතාවෙන් එක් කරුණකට නිදසුන් **දෙක** බැගින් දක්වමින් අගයන්න. (ලකුණු 15 යි.)

**නැතහොත්**

සිංහල අලුත් අවුරුදු කාලය
(i) ස්වාභාවික පරිසරය කෙරෙහි හා
(ii) මිනිස් ක්‍රියාකාරකම් කෙරෙහි බලපාන ආකාරය

'වසන්ත සමය' පැදි පෙළෙහි මැනවින් නිරූපිත ය. එක් කරුණකට නිදසුන් **දෙක** බැගින් දක්වමින් විමසන්න.

(ලකුණු 15 යි.)

**4.** (i) අනුප්‍රාස භාවිතය සහ
(ii) එළිසම භාවිතය

සඳ කිඳුරු දා කවෙහි සාර්ථකත්වයට ඉවහල් වී ඇති ආකාරය 'කිඳුරු වලප' ඇසුරෙන් නිදසුන් **දෙක** බැගින් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 15 යි.)

**නැතහොත්**

(i) තණ්හාව, විනාශය ගෙන දෙන බව හා
(ii) දූරදර්ශී වීම සාර්ථක ජීවිතයකට පදනම වන බව

වේදබ්භ ජාතකය ඇසුරෙන් එක් කරුණකට නිදසුන් **දෙක** බැගින් දක්වමින් පෙන්වා දෙන්න. (ලකුණු 15 යි.)

- **5, 6, 7** ප්‍රශ්නවලින් **එකකට** පමණක් උත්තර ලියන්න. උත්තරයක වචන **100**ක් පමණ තිබීම සෑහේ.

**5.** කථකයාගේ හැඟීම් ප්‍රකාශ කිරීම සඳහා උචිත භාෂා විලාසයක් භාවිත කිරීමට කවියා උත්සුක වී ඇති ආකාරය 'පියසේන ඇසූ ප්‍රශ්නයක්' පැදි පෙළෙන් නිදසුන් **තුනක්** දක්වමින් විස්තර කරන්න. (ලකුණු 10 යි.)

**6.** "යහපත් සිතින් සුළු දෙයක් දන් දීමෙන් පවා ඉතා විශාල ප්‍රතිලාභ ලැබිය හැකි බව 'උත්තරෝලිය වස්තුවෙන්' පෙන්වා දෙයි." නිදසුන් **තුනක්** සහිත ව පහදන්න. (ලකුණු 10 යි.)

**7.** "ප්‍රබල නාට්‍යමය අවස්ථා ගොඩනැංවීම සාර්ථක නාට්‍යයක ලක්ෂණයකි." 'මඟුල් ප්‍රස්තාව' නාට්‍යයෙන් නිදසුන් **තුනක්** දක්වමින් තහවුරු කරන්න. (ලකුණු 10 යි.)

***

Department of Examinations, Sri Lanka
Department of Examinations, Sri Lanka